මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/4/1/16
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.03.17

**ජාතික අයවැය චක්‍රලේඛ අංක:01/2016**

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>රාජ්‍ය ආයතන සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම සඳහා මාර්ගෝපදේශ</u>**

රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීමේදී පෙර පැවති ක්‍රමයට වඩා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීම පිරිවැය අතින් වඩා ප්‍රතිඵලදායක බැවින්, 2016 අයවැය මගින් යෝජනා කරන ලද පරිදි රජයේ අවශ්‍යතා සඳහා ප්‍රසම්පාදනය කිරීමේ යෝජනාව ඇතුලත් අංක MF/TIP/03/CM/2016/31 දරන 2016.03.04 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, සියළු රාජ්‍ය ආයතන විසින් ඉදිරියේදී වාහන ප්‍රසම්පාදනය කිරීමේදී මෙම චක්‍රලේඛය මගින් පැහැදිලි කෙරෙන මාර්ගෝපදේශ අනුගමනය කළයුතු බවට උපදෙස් දෙනු ලැබේ.

**1. හිමිකම:**

ඒකාබද්ධ අරමුදලෙන් වියදම් දරන රාජ්‍ය ව්‍යාපාර ද ඇතුළුව රාජ්‍ය ආයතන විසින් වාහන ප්‍රසම්පාදනය කිරීමේදී මෙම චක්‍රලේඛය මගින් නියම කෙරෙන මාර්ගෝපදේශ, මෙම චක්‍රලේඛයේ දින සිට දැඩිව අනුගමනය කරන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ. කෙසේ වුවද, පහත 5 ඡේදයේ සඳහන් වාහන වර්ග ප්‍රසම්පාදනයේදී මෙම ක්‍රමය අදාළ නොවේ.

**2. අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය:**

මෙම ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමේදී පහත අවශ්‍යතා සම්පූර්ණ කළයුතු වේ.

**2.1 රාජ්‍ය ආයතන වෙතින් කෙරෙන වාහන ඉල්ලීම්:**

මෙම ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය සඳහා වන සියළු ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළයුතු වේ. ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශයේ, අදාළ දෙපාර්තමේන්තු හා ආයතනවල වාහන අවශ්‍යතාවය සාධාරණ බවට තහවුරු කිරීමට අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දෙනු ලැබේ. වාහන සඳහා වන එවැනි ඉල්ලීම් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට එවීමට පෙර අදාළ අමාත්‍යාංශ ලේකම් සභාපතිත්වය දරණ කමිටුවක් මගින්

සමාලෝචනය කළයුතු වේ. එම කමිටුව විසින් ආයතන සතු වාහන ප්‍රමාණය, ඒවායේ වයස (යම් පවත්නා වාහනයක් වෙනුවට වෙනත් වාහනයක් ලබාගන්නේ නම් පවත්නා වාහනය අවුරුදු 10 කට වඩා පැරණි වියයුතුය.) වාහනයේ තත්ත්වය, ඉන්වෙන්ට්‍රියේ ඇති වාහන සංඛ්‍යාව, වාර්ෂික නඩත්තු වියදම, අනුයුක්ත වාහන සංඛ්‍යාව, ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන්ගේ සංඛ්‍යාව සහ අංක 2/2015 හා 2015.10.07 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය යටතේ අපහරණය කරන ලද වාහන සංඛ්‍යාව ආදිය පිළිබඳව සමාලෝචනය කළයුතුය.

## 2.2 මහා භාණ්ඩාගාරයේ අනුමැතිය:

ඕනෑම රාජ්‍ය ආයතනයක් විසින් මෙම ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය කිරීමට ප්‍රථම, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ. අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත පදනම්ව එවැනි අනුමැතීන් ලබාදෙනු ලැබේ. ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් සම්පාදනය කරන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් ඉල්ලුම් කරන ලද වාහන සඳහා අනුමැතිය ලබාදීමේ බලය ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවන අතර, ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් සම්පාදනය කරනු නොලබන රාජ්‍ය ව්‍යාපාර විසින් ඉල්ලුම් කරනු ලබන වාහන සඳහා අනුමැතිය ලබාදීමේ බලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා වන ඉල්ලීම් (අදාල වන පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව), අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව, නියමිත පරිදි සම්පූර්ණ කරන ලද මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 හි සඳහන් ආකෘති පත්‍රය සමග ආයතන ප්‍රධානීන් විසින් ඉදිරිපත් කළයුතු වේ.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය:

2.2 ඡේදයේ සඳහන් අනුමැතිය මත පදනම්ව රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරඟකාරී මිල ගණන් (ලංසු) කැඳවීම හරහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යොදා ගනිමින් භාවිතා කර ආපසු භාරදීම ( use and return) පදනම්ව රජයේ ආයතනවලට අවශ්‍ය වාහන ප්‍රසම්පාදනය කල හැක. මෙහිදී වාහන සැපයුම්කරු ( lessor) විසින් වසර 5 ක කාලයක් (මාස 60 ක්) සඳහා වාහනය සම්පූර්ණයෙන් නඩත්තු කළයුතු අතර, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ස්ථාවර බදුකුලී පදනම්ව වාහන සැපයිය යුතුවේ.

**I.** <u>**වාහනයේ තත්ත්වය**</u> **:** මෙම ක්‍රමය යටතේ ලබාගත හැක්කේ, අළුත්ම වාහන හෝ කුලියට ලබාදෙන අවස්ථාවේදී ධාවන දුර ප්‍රමාණය කි.මී.1,000ට අඩු ලියාපදිංචි නොකරන ලද වාහන පමණි.

**II.** <u>**සුදුසුකම් ලබන සැපයුම්කරුවන් (කල්බදුකරු)**</u>**:** කල්බදුකරු, අවම වශයෙන් වාහන 10 කට වඩා සංචිතයක් සහිත ශ්‍රී ලංකාවේ ඇති ලෝක ප්‍රකට වාහන සන්නාමයන්හි වරලත් වාහන නියෝජිතයින්, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි මූල්‍ය ආයතන සහ මෝටර් රථ කුලියට ලබාදීමේ සේවාවන් (එනම්, මෝටර් රථ කුලියට දීමේ ව්‍යාපාර) වියයුතුය.

III. **සැපයිය යුතු සේවාවන්:** හදිසි අනතුරු අළුත්වැඩියා වියදම් මෙන්ම රක්ෂණය හා අනෙකුත් අදාළ ගාස්තු ඇතුළු සියළුම නිරන්තර නඩත්තු වියදම් කල්බදුකරු විසින් දැරිය යුතුය. අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා පැය 24 කට වඩා වැඩි කාලයක් වැයවන්නේ නම් හෝ කල්බදුලාභියාගේ අවශ්‍යතාවය මත ඊට අඩු කාලයක් ගතවන්නේ නම්, කල්බදුකරු විසින් එම වාහනයට සමාන වර්ගයේ වාහනයක් ලබාදිය යුතුවේ.

IV. **ව්‍යවර්තනයන්:**

කවර හෝ රජයේ සහනදායී බලපත්‍ර ක්‍රමයක් යටතේ ආනයනය කරන ලද වාහන, මෙම ක්‍රමය යටතේ කල්බදු සඳහා ලබාදිය නොහැක.

**3. වාහන වර්ග:**

පහත 4 වන ඡේදයේ සඳහන් උපරිම බදුකුලී සීමාවන්ට යටත්ව, මෙම ක්‍රමවේදය යටතේ ප්‍රසම්පාදනය කරනු ලබන වාහන සඳහා පහත දැක්වෙන ලක්ෂණ තිබිය හැකිය.

| | | | |
|---|---|---|---|
| අ. | එන්ජින් ධාරිතාවය | මෝටර් රථ | 1300cc - 2500cc |
| | | ඩබල් කැබ් | 2500cc පමණ |
| | | වෑන් | 2500cc පමණ |
| ආ. | ඉන්ධන/එන්ජිමේ වර්ගය | ඩීසල්/පෙට්‍රල්/දෙමුහුම් | |
| ඇ. | ගියර් පද්ධතියේ වර්ගය | මැනුවල්/ස්වයංක්‍රීය/ට්‍රිප්ට්‍රොනික් | |

**4. උපරිම මාසික කුලිය:**

රියදුරන් හා ඉන්ධන රහිතව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ විවිධ කාණ්ඩයන්වල නිලධාරීන්ට අනුයුක්ත කිරීම පිණිස සහ වාහන සංචිත සඳහා, මෙම ක්‍රමය යටතේ ලබාගත හැකි වාහන වෙනුවෙන් අදාල වන උපරිම මාසික බදුකුලී සීමාවන් පහත දැක්වේ.

ඉහත 2.2 ඡේදයේ සඳහන් අනුමැතියට යටත්ව, විදේශීය අරමුදල්වලින් මුල්‍යනය වූ ව්‍යාපෘති ඇතුළුව රාජ්‍ය ආයතන සඳහා ඡේද 3 හි සඳහන් ලක්ෂණ සහිත වාහන එක් එක් නිලධාරී කාණ්ඩය සඳහා පහත උපරිම බදුකුලී සීමාවන් තුල ප්‍රසම්පාදනය කල හැකිය.

| **කාණ්ඩ අංක** | **නිලධාරී කාණ්ඩය / වාහන වර්ගය** | **උපරිම මාසික බදුකුලිය වැට් රහිත (රු.)** |
|---|---|---|
| I | අමාත්‍යාංශ ලේකම්වරුන් හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 300,000/- |
| II | අතිරේක ලේකම්වරු/අධ්‍යක්ෂ ජනරාල්වරු/දිස්ත්‍රික් ලේකම්වරු/මණ්ඩලවල සභාපතිවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 119,500/- |
| III | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු/අධ්‍යක්ෂවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 98,700/- |
| IV | සංචිත වාහන සඳහා ඩබල් කැබ් | 158,000/- |
| V | ආසන 16 මගී ප්‍රවාහන වෑන් | 139,100/- |

5. **මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අදාළ නොවන වාහන කාණ්ඩයන්:**

යෝග්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අදාළ ආයතන සඳහා පහත සඳහන් වාහන ප්‍රසම්පාදනය කළහැකිය.

**5.1** **උපයෝජිත වාහන** - මූල්‍ය ප්‍රතිපාදන පවතින්නේ නම්, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත අදාළ රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා සඳහා ට්‍රැක්ටර්, ලොරි රථ, ට්‍රක් රථ, ගලි බවුසර්, බැකෝ යන්ත්‍ර ආදී උපයෝජිත වාහන ඒ යටතේ ප්‍රසම්පාදනය කළහැක.

**5.2** **බස් රථ/ගිලන් රථ/කෘ කැබ්/ ත්‍රිරෝද රථ/යතුරුපැදි/විශේෂ කාර්ය වාහන:**

ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් හා පවතින මූල්‍ය ප්‍රතිපාදන මත රාජ්‍ය ආයතන විසින් මෙම වාහන ප්‍රසම්පාදනය කළ හැකිය. ඉහත ඡේද 2.2 හි සඳහන් අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වෙතින් මේ සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

6. **සැපයුම්කරු(කල්බදුකරු) හා රාජ්‍ය ආයතන අතර ගිවිසුම්:**

ඉහත සඳහන් සියළුම නියමයන් හා කොන්දේසි ඇතුලත් කර ගිවිසුමකට එළඹිය යුතුය. එනම්, කල්බදුකරු හා රාජ්‍ය ආයතන අතර එකඟතා ගිවිසුමකට අත්සන් කල යුතුය. ආයතනයන් මගින් උචිත වෙනස්කම් සහිතව භාවිතා කළහැකි එකඟතා ගිවිසුමේ නිදර්ශකයක් www.treasury.gov.lk වෙබ් අඩවියෙහි ඇත.

7. **සවිස්තරාත්මක ගෙවීමේ ක්‍රමය:**

ගිවිසුම සඳහා එළැඹ ඇති ආයතනය විසින් කල්බදු කුලී මාසිකව ගෙවිය යුතු අතර, හිඟ මුදල් ඊළඟ වසර සඳහා ඉදිරියට රැගෙන නොආ යුතුය. ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබන ආයතන සඳහා අවශ්‍ය කෙරෙන අයවැය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ඇත. මේ වෙනුවෙන් වෙනම පුනරාවර්තන වැය විෂයක් ඇති කෙරෙනු ලබන අතර, මෙම ක්‍රමය යටතේ වත්කමක් ඇති නොවන නිසා මෙම වියදම මෙහෙයුම් වියදමක් ලෙස සැලකෙනු ඇත.

- ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් නොලබන රාජ්‍ය ආයතන විසින් මෙම වියදම් තම ආදායම් උපයෝගී කරගනිමින් දැරිය යුතුය.
- මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අරමුදල් ලබාගැනීම සඳහා ඉල්ලීම් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමේදී තොරතුරු සැපයීමට හැකිවනු පිණිස අදාළ ආයතන විසින් මෙම ක්‍රමය යටතේ ලබාගත් වාහන වෙනුවෙන් වෙනම ලේඛනයක් පවත්වාගෙන යායුතුය. වාහන වර්ගය, බදුකුලී වටිනාකම සහ කාල පරිච්ඡේදය, අනුයුක්ත හෝ සංචිත වාහන යනාදී තොරතුරු ඒ සඳහා ඇතුලත් වියයුතුය.

8. **වාහන අපගමනයන් හෝ වාහන අවභාවිතයන්**

- අනුයුක්ත වාහනයක් වෙනුවෙන් ප්‍රවාහන දීමනාවක් ලබාගන්නා නිලධාරියෙකුට මෙම ක්‍රමය යටතේ ලබාගත් වාහන ඇතුළු කිසිදු රාජකාරි වාහනයක් භාවිතය සඳහා අවසර නොලැබේ.
- සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය අරමුදල් භාවිතා කරමින් ප්‍රසම්පාදනය කරන අවස්ථාවලදී

ඕනෑම එකහතා ගිවිසුම්වල කවර වාහන සංඛ්‍යාවක් ඇතුලත් කර ඇතත් අමාත්‍යාංශ ලේකම් විසින් සභාපතිත්වය දරන කමිටුව මගින් සියුම්ව පරීක්ෂා කර අවම වාහන සංඛ්‍යාවක් ප්‍රසම්පාදනය කළයුතුය. තනතුර අනුව නිල වාහන සඳහා හිමිකම් ලබන නිලධාරීන් සඳහා විදේශීය අරමුදල් ව්‍යාපෘති යටතේ ප්‍රසම්පාදනය කරන ලද කිසිදු වාහනයක් වෙන් නොකළ යුතුය. තවද, මෙම වාහන සකසුරුවමින් භාවිතා කිරීම/පාවිච්චි කිරීම කළයුතුය.

- මෙම චක්‍රලේඛයේ කොන්දේසියක් කඩකළහොත් එම නිලධාරීන්ට එරෙහිව අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් විනය ක්‍රියාමාර්ගයන් ගතයුතුය.

**9. පූර්ව චක්‍රලේඛයන් අවලංගු කිරීම**

රාජ්‍ය ආයතන සඳහා මුල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය සඳහා වන අංක 150/2010 හා 2010.12.07 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය මෙම චක්‍රලේඛයේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ.

**10. පැහැදිලි කිරීම්:**

මෙම චක්‍රලේඛය හා සම්බන්ධ ගැටළු සඳහා පැහැදිලි කිරීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව (011-2484689) හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (011-2484623) වෙතින් අදාළ පරිදි ලබාගත හැකිය.

**ආර්.එච්.එස්.සමරතුංග**
මහා භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

*Annexure 01*

**Approval of the Department of National Budget**
**for Procurement of vehicles under the Operational Leasing Method**

1. Name of the Ministry/Department/Public Enterprise...............................................

2. Type of vehicles requested

| Category | No. of vehicles | Purpose of purchasing- whether Assigned/or pool vehicle | Category No. as per para 4 of the circular if applicable | In case of replacement, manufacturing year and registration number of the existing vehicle |
|---|---|---|---|---|
| Motor Car | | | | |
| Double Cab | | | | |
| Van | | | | |
| Other (pl. specify) | | | | |

3. Reasons for purchasing vehicle/s ..............................................................................................

4. Source of funding (if provisions are available, indicate the vote particulars):
...............................................

5. Details of existing vehicles in the Ministry/Department/ Institute

| Category | Number of vehicles | | | |
|---|---|---|---|---|
| | Own vehicles of the Institutions | | | Uses of Renting/Hiring vehicle |
| | Age less than 05 years | Age 05-10 years | Age more than 10 years | |
| Motor Car | | | | |
| Double Cab | | | | |
| Van | | | | |
| Other (pl specify) | | | | |

6. Contact person's name and Telephone No.......................................................

6.1 Recommended/Not Recommended

................................................
Head of the Department/Institution
Date.................................

6.2 Having reviewed at the committee, the following vehicles are recommended

| Category | No. of vehicles |
|---|---|
| Motor Car | |
| Double Cab | |
| Van | |
| Other (pl. specify) | |

.....................................................
Secretary to the Ministry/Chief Secretary
Date ......................................

**(Specimen)**

# AGREEMENT TO HIRE MOTOR VEHICLE/S

**«Agreement No»**

This Agreement is made and entered into this .... Day of ........, 2016 by and between ........................a company duly incorporated under companies Act No. ---------- having its registered office at ........................ under Registration certificate No.--------in the Democratic Socialist Republic of Sri Lanka and (hereinafter called and referred as the " the owner" which term or expression as herein used shall where the context so requires or admit mean and include the said .............. and its successors and assigns of the **PARTY OF THE FIRST PART**.

**AND**

....................................................................of Ministry[1] of ....................in the said Republic (hereinafter called and referred to as the "the Hirer' which term or expression as hereinafter used shall mean and include the said ..................... and his/her heirs, successors and assigns) of the **PARTY OF THE SECOND PART.**

WHEREAS the Hirer is desirous of hiring from the Owner the motor vehicle/s belonging to the Owner and described in the First Schedule to this agreement (hereinafter referred to as the "Vehicle/s") and the Owner has agreed with the Hirer to hire the vehicle/s to the Hirer subject to and upon certain terms and conditions which have been accepted by the Hirer and the parties hereto desire to embody all of same in a formal written agreement.

**NOW THIS AGREEMENT THEREFORE WITNESSETH** that in consideration of the parties hereto doing, observing and performing all of the respective terms, conditions, covenants, stipulations and obligations contained in this Agreement to be done, observed and performed respectively by either of them, the parties hereto hereby agree as follows:-

## 1. HIRE OF VEHICLE

Subject to and upon the terms and conditions contained in this Agreement the Owner shall provide the vehicle/s to the Hirer on hire and the Hirer shall hire the vehicle/s as from the **Date** and during the entirety of the definite and ascertained period of Sixty Months ( 60) commencing from the **Date** ------and ending on the **Date** ---- (hereinafter referred to as "the period, terms and conditions of the Agreement " ).

## 2. INSURANCES AND LISENCES

(a) The Owner shall at its own cost keep the vehicle/s comprehensively insured throughout the period with an insurer chosen by the Owner at its absolute discretion. The hirer shall acquaint himself with the scope of the insurance cover taken by the owner.

---

[1] If it is a Ministry - the Secretary to the Ministry
If it is Department - the head of that Department/ the name of the Dept as the case may be
If it is a Statutory Board - name of the Statutory Board

(b) The Owner shall keep the vehicle/s licensed throughout the period by having a valid revenue license and ....... applicable charges (eg. Emission tax etc.) in respect of the vehicle/s from a relevant authority.

## 3. HIRE CHARGE

(a) The Hirer shall pay to the Owner on or before the 30th day of each and every month within the period, a monthly hire charge of the sum of **Rupees «Hire Charge In Words» (excluding VAT) in** respect of each above mention month or the said sum of money plus such amount as shall be computed at the rate of **Rupees «Rate per Km In words»+ (excluding VAT) (Rs.«Rate per Km In Nos»/-+(excluding VAT)** per each kilometer in respect of every kilometer in excess of **Three thousand kilometers (3,000 Km)** in the event that the vehicle/s has/have during such month run in excess of **Three thousand kilometers (3,000 Km)** provided however that the Hirer shall not be entitled to any reduction whatever in the monthly hire charge in the event of the vehicle/s running less than the said of **Three thousand kilometers (3,000 Km)** in any particular month, it being a condition of this agreement that the agreement is being entered into on the basis that the Hirer shall use the vehicle/s each month for running of **Three thousand kilometers (3,000 Km)** per month at the minimum.

## 4. MAINTENANCE OF VEHICLE/S

(a) The Hirer shall ensure that the vehicle is maintained in good order and condition throughout the period. The Owner shall take further arrangement for the vehicle to be regularly serviced and maintained and for all repairs necessary to the vehicle/s to be promptly attended to and be done only by the Owner or any other company nominated by the Owner for that purpose.

(b) All such routine services, all the maintenance and repairs of the vehicle, shall be borne by the Owner.

(c) The owner shall bear the cost of expenses on accidental repairs and other related fees. If the repairs/maintenance work takes more than 24 hours, the owner shall provide a replacement vehicle of a similar type and condition.

## 5. USE OF VEHICLE/S

(a) It shall be the responsibility of the Hirer to ensure that the vehicle/s is driven only by drivers who are qualified to do so and that the vehicle/s is driven by such drivers, with due diligence and care, so as to avoid any harm or damage to the vehicle/s.

(b) The Hirer shall not do any act nor allow or suffer any omission which may directly or indirectly negate, nullify or render invalid the Insurance Policy over the vehicle/s obtained by the Owner in accordance with Clause 2(a) of this agreement.

(c) The Hirer shall not use or suffer the vehicle/s to be used for any illegal purpose and in the event of the Owner, as the registered Owner of the vehicle/s being charged before a court, tribunal, forum, person or body for or in connection with or relating to any offence

whatsoever arising from or in respect of the vehicle/s and/or the use of the vehicle/s during the period, including but not limited to a fatal or other accident, the Hirer shall forthwith thereupon keep the Owner freed, absolved and indemnified there from and any and all liabilities arising there from by appearing before such court, tribunal, forum, person or body and accepting full responsibility for such offence as the Hirer and the person in possession and custody of the vehicle/s at the time of the commission of such offence.

(d) The hirer shall keep the owner also freed and indemnified at all times from all claims whatsoever whether in civil law or any other statutory or common law or otherwise howsoever that may arise from or in respect of in connection with the vehicle/s and/or the use of the vehicle/s during the period and the Hirer shall bear all costs of the litigation and other expenses of the Owner in any action, suit or proceedings that may be brought, instituted or commenced in that respect before any court, tribunal, forum, person or body against the owner whether jointly with the Hirer or otherwise and the Hirer shall meet in full any judgement, order, decree or award made against the Owner pursuant thereto.

**6. TERMINATION OF AGREEMENT**

(a) The Hirer may terminate this Agreement with the consent of the owner after giving three months notice in writing, if the vehicle is not maintained properly by the owner/hirer or immediately in case of a major mechanical fault which recurs very often, provided however, that such mechanical failure is not caused by negligence and misuse by the hirer.

(b) The Owner and Hirer may however determine the Agreement to have been prematurely terminated prior to the expiry of the period under mutual agreement for any valid reason. In that event either party shall give three months prior notice to the other party. The Hirer shall upon such premature termination of the Agreement deliver the vehicle/s to the Owner in good order and condition and pay all dues of the Owner.

**7. ASSIGN ABILITY OF THE AGREEMENT**

(a) The Hirer may not assign this Agreement or any rights there under in any manner howsoever and shall not part with the custody and control of the vehicle/s howsoever during the validity of the Agreement. The Hirer shall upon the termination of the Agreement at the end of the period or prematurely deliver the vehicle/s in good order and condition in accordance with the relevant provisions contained in this Agreement.

**First Schedule Above Referred To**

| Reg. No | Make | Model | Colour | Chassis No | Engine No |
|---|---|---|---|---|---|
| «RegNo» | «Make» | «Model» | «Colour» | «Chassis» | «Engine» |

**IN WITNESS WHEREOF** the said owner---- and the said Hirer------ have hereunto and to one others of the same tenor and date as These Presents set their respective hands at COLOMBO on this --- date ------ 2016.

**WITNESSES:-**

The Common Seal of the said<br>( owner ) ---- (Privet) Limited<br>was affixed in the presence of }

1.

2.

The Common Seal /the official Seal<br>of the said ---------------<br>was affixed in the presence of }

1.

2.